කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

# ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය
# GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

**2024 දෙසැම්බර් මස 10 දින සඳහා කාලගුණ අනාවැකිය**
**2024 දෙසැම්බර් මස 10 දින උදෑසන 05.30 ට නිකුත්කරන ලදි.**

**ගිනිකොණදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පැවති අඩු පීඩන කලාපය තවදුරටත් පවතින අතර එය බටහිර-වයඹ දෙසට ගමන් කරමින් දෙසැම්බර් 11 වනදා පමණ ශ්‍රී ලංකා-තමිල්නාඩු වෙරළට ඔබ්බෙන් නිරිත දිග බෙංගාල බොක්ක වෙත ළඟා වීමට බොහෝ දුරට ඉඩ ඇත.**

උතුරු, උතුරු මැද සහ නැගෙනහිර පළාත්වල විටින් විට වැසි ඇතිවේ.

සෙසු ප්‍රදේශවල සවස් කාලයේ හෝ රාත්‍රී කාලයේ තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක.

බස්නාහිර සහ සබරගමුව පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථානවලට **මි.මී. 75 පමණ** තරමක් තද වැසි ඇතිවිය හැක.

මධ්‍යම, සබරගමුව, දකුණ, ඌව, බස්නාහිර සහ වයඹ පළාත්වල උදෑසන කාලයේදී මීදුම් සහිත තත්ත්වයක් පැවතිය හැක.

**ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මගින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

## WEATHER FORECAST FOR 10 DECEMBER 2024
**Issued at 05.30 a.m. on 10 December 2024**

**The Low-Pressure area still persists over southeast Bay of Bengal and is likely to continue to move west-northwestwards and reach over southwest Bay of Bengal off Sri Lanka – Tamil Nadu coasts around 11th December.**

Showers will occur at times in Northern, North-central and Eastern provinces.

Showers or thundershowers may occur at several places elsewhere during the evening or night.

Fairly heavy showers **about 75mm** are likely at some places in Western and Sabaragamuwa provinces and in Galle and Matara districts.

Misty conditions can be expected in Central, Sabaragamuwa, Southern, Uva, Western and North-western provinces during the morning.

**The general public is kindly requested to take adequate precautions minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk



**ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය**
**2024 දෙසැම්බර් මස 10 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.**

**ගිනිකොණදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පැවති අඩු පීඩන කලාපය තවදුරටත් පවතින අතර එය බටහිර-වයඹ දෙසට ගමන් කරමින් දෙසැම්බර් 11 වනදා පමණ ශ්‍රී ලංකා-තමිල්නාඩු වෙරළට ඔබ්බෙන් නිරිත දිග බෙංගාල බොක්ක වෙත ළඟා වීමට බොහෝ දුරට ඉඩ ඇත. බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ කටයුතු සිදුකරන නාවික සහ ධීවර ප්‍රජාවන් මේ සම්බන්ධයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ඉදිරි අනාවැකි සහ නිවේදන පිළිබඳව අවධානයෙන් පසුවන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.**

**වැසි තත්ත්වය:**

පොතුවිල් සිට මඩකලපුව, ත්‍රිකුණාමලය ,කන්කසන්තුර සහ මන්නාරම හරහා පුත්තලම දක්වා වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි ඇති වේ . පුත්තලම සිට කොළඹ සහ ගාල්ල හරහා හම්බන්තොට දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල ස්ථාන ස්වල්පයක සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක.

**සුළඟ:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං ඊසාන දිශාවෙන් හමයි. සුළං වේගය **පැ.කි.මී. (30-40)** පමණ වේ. පුත්තලම සිට කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය ක්ෂණිකව **පැ.කි.මී. 50** පමණ දක්වා ඉහළ යා හැක.

**මුහුදේ ස්වභාවය:**

පුත්තලම සිට කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා වන මුහුදු ප්‍රදේශවල විටින් විට තරමක් රළු විය හැක. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශ විටින් විට මද වශයෙන් රළු වේ .

**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.**

**WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS**
**Issued at 05.30 a.m. on 10 December 2024**

**The Low-Pressure area is still persisting over southeast Bay of Bengal and is likely to move west-northwestwards and reach over southwest Bay of Bengal off Sri Lanka – Tamil Nadu coasts around 11th December. Navel and fishing communities, engaging activities over South-west Bay of Bengal are requested to be attentive to the future forecasts and bulletins issued by the Department of Meteorology in this regards.**

**Condition of Rain:**

Showers will occur at times in the sea areas extending from Pottuvil to Puttalam via Batticaloa, Trincomalee, Kankasanthurai and Mannar. Showers or thundershowers will occur at a few places in the sea areas off the coast extending from Puttalam to Hambantota via Colombo and Galle during the evening or night.

**Winds:**

Winds will be North-easterly in direction in the sea areas around the island. Wind speed will be **(30-40) kmph**. Wind speed can increase up to **50 kmph** at times in the sea areas extending from Puttalam to Trincomalee via Kankasanthurai.

**State of Sea:**

The sea areas extending from Puttalam to Trincomalee via Kankasanthurai will be fairly rough at times. The other sea areas around the island will be moderate.

**Temporarily strong gusty winds and very rough seas can be expected during thundershowers.**

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100,
Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100,
තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි